කොළොන්නාව නගර සභාව - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

කොළොන්නාව නගර සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය , එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට කොළොන්නාව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
නගර සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම.

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රමිතියේ 3 වන පරිච්ඡේදයේ 3.31 ඡේදය ප්‍රකාරව වත්කම් ඉවත් කිරීමේ අලාභය රු. 344,497 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ගැලපුම් යටතේ දක්වා නොතිබුණි.	වත්කම් ඉවත් කිරීමේ අලාභය රු. 344,497.43 ක් ස්ථාවර වත්කම් විකිණීමේ අලාභ නමින් ගලපා තිබුණු බව.	ප්‍රමිතිය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය.
(ආ)	ප්‍රමිතියේ 3 වන පරිච්ඡේදයේ 3.30 ඡේදය ප්‍රකාරව මුදලින් ලද ප්‍රග්ධන වියදම් ප්‍රදාන රු. 4,147,924 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ එය රු. 48,203,862 ක් ලෙස ගැලපීමෙන් රු. 44,055,938 ක් මුදල් ගලාඒම් වැඩි වශයෙන් දක්වා තිබුණි.	ඉදිරියේදි වර්ෂය තුළදී මුදලින් ලද ප්‍රාග්ධන වියදම් ප්‍රදාන වටිනාකම පමණක් ගැලපීම් කරන බව.	ප්‍රමිතිය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය.
(ඇ)	ප්‍රමිතියේ 17 වන පරිච්ඡේදයේ 17.2 ඡේදය ප්‍රකාරව වැල්ලම්පිටිය සාප්පු සංකීර්ණය සඳහා 2024 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු බිල්පතක් සඳහා වූ රු. 7,157,040 ක් 2025 ජනවාරි 31 දින ගෙවා තිබුණද, ගිණුම්වලින් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.	ව්‍යාපෘති සඳහා වර්ෂය තුළ ඉටුකරන්නේ යැයි අපේක්ෂිත වටිනාකම සඳහා වන ඇස්තමේන්තු මුදල පමණක් වාර්ෂික අයවැයෙන් ප්‍රතිපාදන වෙන් කිරීමටත් වර්ෂය තුළ නිම කර ඇති නොගෙවූ බිල්පත් වටිනාකම ණයහිමි ලෙස වෙන් කිරීමටත් කටයුතු කරන බව.	ප්‍රමිතිය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය.

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් කළ මාරු කිරීම් රු. 186,810,708 ක් වුවද, එය රු. 186,922,678 ක් ලෙස දක්වා තිබුණු අතර ඒ තුළ විවිධ ආදායමට බැර විය යුතු රු. 111,970 ක් ද ඇතුළත් වී තිබුණි.	2025 වර්ෂයේ සිට විවිධ ආදායම් ශීර්ෂය යටතේ ගිණුම්ගත කරන බව.	නිවැරදිව ගිණුම්ගත කිරීම් සිදු කළ යුතුය.
(ආ)	ගොඩනැගිලි ගිණුමට හර කළ යුතු අවමංගල්‍යශාලා පහසුකම් පුළුල් කිරීම වෙනුවෙන් ගෙවිය යුතු රු. 14,599,323 ක් සවිකිරීම් ගිණුමට හර කර තිබුණි.	ගෙවිය යුතු වියදම් ගොඩනැගිලි ගිණුමට ගිණුම්ගත කරන බව.	ගිණුම් නිවැරදිව වර්ගීකරණය කළ යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට ප්‍රාග්ධන ප්‍රදානවලින් ව්‍යාපෘතිවලට අදාළව ගෙවිය යුතු සත්‍ය වියදම රු. 9,442,834 ක් වුවද, ගිවිසුම්ගත වටිනාකම් ගිණුම්ගත කිරීම නිසා ලැබිය යුතු ප්‍රාග්ධන ලැබීම් හා ප්‍රාග්ධන වියදම් දීමනා රු. 9,442,834 ක් වැඩියෙන් දක්වා තිබුණි.	2024 වර්ෂයේ නිවැරදි වටිනාකම සඳහා ක්‍රමක්ෂය ගණනය කරන බව.	නිවැරදිව ගිණුම්ගත කිරීම් සිදු කළ යුතුය.
(ඈ)	ක්‍රීඩා උපකරණ සඳහා වැයකරන ලද රු. 458,571 ක් වෙනුවෙන් රු. 435,643 ක් පළාත් පාලන ආයතනයෙන් ලැබී තිබුණද, එම මුදල ප්‍රාග්ධන ප්‍රදාන යටතේද ගිණුම්ගත කිරීමෙන් ලැබිය යුතු ප්‍රාග්ධන ලැබීම් සහ ප්‍රාග්ධන වියදම් දීමනා රු. 435,643 ක් වැඩියෙන් දක්වා තිබුණි.	වැඩියෙන් ගිණුම්ගත කිරීම නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම්ගත කිරීම් සිදු කළ යුතුය.
(ඉ)	කර්මාන්ත ණයහිමි වෙන්කිරීමේදී එම බිල්පත් වටිනාකම් සැළකිල්ලට නොගෙන ගිවිසුම්ගත වටිනාකම් ගිණුම්ගත කිරීම නිසා රු. 9,230,435 ක් ණයහිමි සහ වත්කම් වටිනාකම් වැඩියෙන් දක්වා තිබුණි.	ණයහිමි ගිණුමෙන් හා අදාළ වත්කම් ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව වටිනාකම් ගිණුම්ගත කළ යුතුය.

(ඊ)	කර්මාන්ත ණයහිමි හා ණයගැති වෙන් කිරීමේදී රඳවුම් මුදල් සැලකිල්ලට නොගෙන වටිනාකම් නිශ්චය කිරීම නිසා ණයහිමි සහ ලැබිය යුතු ප්‍රාග්ධන ලැබීම් ශේෂ රු. 622,523 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.	රු. 168,277 ක වටිනාකම සමුච්චිත අරමුදල් අධිකතා ඌණතා ගිණුමට ගලපා ඇති බව.	නිවැරදිව වටිනාකම් ගිණුම්ගත කළ යුතුය.
(උ)	ක්ෂය අඩුවෙන් හා වැඩියෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ මුළු ක්ෂය වියදම රු.2,258,635 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.	ක්ෂය වටිනාකම රු. 50,362 ක මුදල ගිණුම්ගත කරන බව. වෙනස රු. 2,308,997 ක් නිවැරදි කරන බව.	නිවැරදිව වටිනාකම් ගිණුම්ගත කළ යුතුය.
(ඌ)	2022 වර්ෂයේ ණයහිමි හා වත්කම් ගිණුම්වලට ගිණුම්ගත කරන ලද රු. 550,000 ක් වූ මීතොටමුල්ල කසළ අංගනයේ ඇති ගොඩනැගිල්ලේ වයරින් කිරීමේ ව්‍යාපෘතිය අතහැර දමා තිබුණද, එය ගිණුම්වලින් ඉවත් නොකිරීම නිසා ණයහිමි සහ වත්කම් වටිනාකම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	වත්කම් හා ණයහිමි ගිණුම්ගත කිරීම ඉවත් කිරීමත්, ගොඩනැගිලි ක්ෂය කරන ලද වටිනාකම වන රු. 13,750 ක් ඉවත් කිරීම නිවැරදි කරන බව.	නිවැරදිව වටිනාකම් ගිණුම්ගත කළ යුතුය.
(එ)	පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් කළ මාරු කිරීම් ගණනයේදී 2024 වර්ෂයේ ලද ප්‍රාග්ධන ප්‍රදාන මඟින් ස්ථාවර වත්කම් ක්‍රමක්ෂය වටිනාකම රු. 2,471,598 ක් ප්‍රවර්තන වර්ෂයේ ආදායමට ගැනීමෙන් එම වටිනාකමින් ආදායම වැඩිවී තිබුණි.	රු. 2,471,598 ක වටිනාකම නිවැරදි කරන බව.	නිවැරදිව වටිනාකම් ගිණුම්ගත කළ යුතුය.
(ඒ)	නගර සභා ගොඩනැගිල්ල වයරින් කිරීමේ උපදේශන හා අධීක්ෂණ ගාස්තුව රු. 360,000 ක් ගොඩනැගිලි ගිණුමට හර කිරීම වෙනුවට සවිකිරීම් ගිණුමට හර කර තිබුණි.	අධීක්ෂණ ගාස්තුව රු. 360,000 ක් සවිකිරීම් ගිණුමේ ගිණුම්ගත කිරීම නිවැරදි කරන බව.	ගිණුම් නිවැරදිව වර්ගීකරණය කළ යුතුය.
(ඔ)	ජංගම වත්කම් යටතේ හඳුනානොගත් ශේෂය රු. 40,968,364 ක් වුවද, ඉන් ජංගම වගකීම් යටතේ දැක්විය යුතු ගෙවිය යුතු රු. 1,278,233 ක වැට් බදු ශේෂය අඩුකර හඳුනානොගත් ශේෂ ලෙස රු. 39,690,130 ක් දක්වා තිබුණි.	හඳුනා නොගත් ශේෂ ගිණුම්ගත කිරීමේදී ජංගම වත්කම් හා ජංගම වගකීම් ලෙස වෙන් වෙන් වශයෙන් ගිණුම්ගත කරන බව.	ගිණුම් නිවැරදිව වර්ගීකරණය කළ යුතුය.

(ඕ)	වැල්ලම්පිටිය සාප්පු සංකීර්ණය ඉදිකිරීම වෙනුවෙන් 2023 වර්ෂයේදී කොන්ත්‍රාත්කරුට ගෙවන ලද මුදල් කෙරීගෙනයනවැඩ ගිණුමට හර කරනු වෙනුවට ගොඩනැගිලි ගිණුමට හර කර තිබුණි.	2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේදී ගිණුම්ගත කරන බව.	නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

1.7 අනුකූල නොවීම්

1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

	නීති රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	නගර සභා ආඥා පනත 45 වගන්තිය	මාර්ග කැණීම් හා මලාපවහනය සඳහා සිදු කරන ලද කැණීම් අවස්ථා හතරකදී වර්ග මීටර 176 කට පෙර මුසු යොදා පාරවල් නැවත සකස් කිරීම සඳහා රු. 958,559 ක ගාස්තු අයකරගෙන තිබුණද වර්ෂ අවසානය දක්වා එම පාරවල් සකස් කර නොතිබුණි.	ලේඛනයක් පවත්වා ගැනීමට වැඩ පරිපාලකවරුන්ට උපදෙස් දී ඇති අතර මේවන විට එය නඩත්තු කරමින් පවතින බව.	අදාළ අලුත්වැඩියාවන් සිදු කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ 371(5)	2024 ප්‍රථම මාස 04 ඇතුළත ලබාගත් අත්තිකාරම් රු. 113,300 ක් පියවීමට දින 23 සිට දින 106 ක් දක්වා කාල පරාසයක ප්‍රමාදයක් සිදුව තිබුණි.	ඉදිරියේදී මු.රෙ 371(5) ප්‍රකාරව කටයුතු කරන බව.	මුදල් රෙගුලාසිය ප්‍රකාරව අත්තිකාරම් පියවීම සිදු කළ යුතුය.
(ඇ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය	සභාව සතු වාහන 06 ක ඉන්ධන දහනය සම්බන්ධයෙන් පරීක්ෂාවක් සිදුකර නොතිබුණි.	සෑම මාස 06 කට වරක්ම එසේ ඉන්ධන දහන පරීක්ෂාව සිදුකිරීමට කටයුතු කරන බව.	චක්‍රලේඛය ප්‍රකාරව වාහනවල ඉන්ධන දහන පරීක්ෂාව සිදු කළ යුතුය.

1.7.2 බදු අවශ්‍යතාවයට අනුකූල නොවීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
වර්ෂ 05 කට ආසන්න කාලයක සිට හඳුනානොගත් ශේෂයක් ලෙස ඉදිරියට ගෙන එන රු. 1,278,234 ක ගෙවිය යුතු වැට් ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	දේශීය ආදායම් කොමසාරිස් වෙතින් තවදුරටත් විමසා ඉදිරි කටයුතු සිදු කිරීමට කටයුතු කරන බව.	වගකීම් නිරවුල් කිරීමට කටයුතු සිදු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු. 55,860,560 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්මවූ ආදායම රු. 34,263,400 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කරන ලද සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	2024				2023			
ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තුගත ආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31දිනට මුළු හිඟය	ඇස්තමේන්තුගත ආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31දිනට මුළු හිඟය
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
(i) වරිපනම් හා බදු	216,102,000	171,124,004	168,884,614	80,101,733	100,000,000	92,623,581	86,617,771	79,421,106
(ii) කුලී	31,054,068	11,124,119	22,223,433	10,075,817	11,252,616	11,444,682	10,435,416	10,092,266
(iii) බලපත්‍ර ගාස්තු	1,250,000	1,250,000	1,537,400	-	600,000	721,000	721,000	-
(iv) වෙනත් ආදායම්	75,378,000	75,378,000	78,143,565	-	6,521,028	5,659,527	5,659,527	-
එකතුව	**323,784,068**	**258,876,123**	**270,789,012**	**90,177,550**	**118,373,644**	**110,448,790**	**103,433,714**	**89,513,372**

2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවති හිඟහිටි වරිපනම් රු. 80,101,733 ක් තුළ රු. 50,000 කට වැඩි ශේෂ 97 කින් රු. 26,622,207 ක් අයවිය යුතුව තිබූ අතර එය මුළු හිඟයෙන් සියයට 33 ක් විය.	අයකර ගැනීමට කටයුතු කරන බව.	හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ) කඩ කාමර 164 කින් 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂය රු. 7,842,359 ක් වූ අතර වර්ෂය තුළදී ලැබී තිබුණු මුළු කඩකුලී රු. 9,576,070 ක් අතරින් රු. 2,649,626 ක් පෙර වර්ෂයන් සඳහා වූ හිඟ කඩකුලී අයකිරීම් විය.	කඩ කාමරයන් හී හිඟ මුදල් නව කඩකාමර ලබා දීමේදි අය කිරීමට කටයුතු යොදා ඇති බව.	හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

(ඇ) පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් නිලධාරීන්ගෙන් 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු. 226,518,124 ක් වූ අතර එය 2022 සිට 2024 දක්වා වර්ෂයන්හිදී ඇස්තමේන්තු කළ මුදලින් ලැබිය යුතු මුදලක් විය.	නීතිඥවරුන්ගේ අතපසුවීම් මත ඔප්පු ලේඛන මගින් අයවිය යුතු ඔප්පු මුද්දර ගාස්තු අයකර ගැනීමට ලේඛන සකස්කොට භාර දී ඇති බව.	ප්‍රමාදයකින් තොරව ගාස්තු අය කර ගැනීමට කටයුතු කළ යුතුය.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **අනාර්ථික ගනුදෙණු**

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
කාන්තාවන් 250 දෙනෙකුගේ සහභාගීත්වයෙන් රු. 360,606 ක් වැය කර කාන්තා දිනය පවත්වා තිබූ අතර එයින් රු. 14,000 ක් වර්ණ A4 කඩදාසිවලින් මල් පිළියෙල කිරීම සඳහා වැයකර තිබුණි.	පාට A4 කඩදාසි සඳහා රු. 12000 ක මුදලක් වියදම් වී ඇති බවත් ඉතිරි වූ කඩදාසිවලින් එදින න්‍යාය පත්‍රය මුද්‍රණය කර ලබාදුන් බව.	සමාජ දරිද්‍රතාවය නැති කිරීමට ඵලදායී වන වියදම් දැරිය යුතුය.

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) මාර්ගය පුළුල් කිරීම නිසා සභාව විසින් ඉදිකළ කඩකාමර කඩා ඉවත් කිරීම හේතුවෙන් කඩ කුලී ආදායම අහිමිව තිබුණු අතර, සභාවට අයත් ඉතිරි වූ බිම් කොටස්වල ව්‍යාපාරිකයින් විසින් නැවත ඉදිකිරීම් කර තිබුණද සභාවට අයත් භූමිය වෙනුවෙන් බිම් කුලී ආදායමක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	බිම්කුලී ගිවිසුම් කෙටුම්පත් ලබා දී ඇති අතර ඒ අනුව ගිවිසුම් ගත වීමට කටයුතු කරන බව.	අදායම් රැස් කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ) කඩ කාමර සහ වෙළඳසැල්වලින් අයවිය යුතු රු. 26,556,763 ක ලැබිය යුතු වරිපනම් වටිනාකමක් පළාත් පාලන අමාත්‍යාංශයේ මේ සඳහාම වූ ඍජු අනුමැතියකින් තොරව කපාහැර තිබුණි.	නගර සභා ආඥා පනත සහ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ ප්‍රකාරව සහා සම්මුති මගින් අත්හැරීම කටයුතු සිදුකිරීම කළ බව.	අදාළ නිසි අනුමැතීන් ලබාගත යුතුය.
(ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව සේවක ණය අත්තිකාරම් රු. 62,569,798 ක් වුවද, ඊට අදාළ උපලේඛනයෙහි ශේෂය රු. 57,696,179 ක් වූයෙන් රු. 4,873,613 ක වෙනස නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී මෙම අගයන් මූල්‍ය ප්‍රකාශය හා නිවැරදි කරන බව.	අදාළ නිවැරදි කිරීම සිදු කළ යුතුය.

(ඈ)	සභාව විසින් පරිහරණය කරනු ලබන ප්‍රත්‍යාගණන වටිනාකම රු. 3,706,300,000 ක් වූ ඉඩම් 21 ක් සඳහා හිමිකම් ඔප්පු නොතිබුණි.	සියලුම දේපළ පවරා ගැනීමේ කටයුතු කඩිනමින් සිදු කරමින් පවතින බව.	පවරා ගැනීම් කඩිනමින් සිදු කළ යුතුය.
(ඉ)	සභාව සතු වාහන 06 ක් සඳහා ආදායම් බලපත්‍ර අවලංගු වන දිනට ලබාගෙන නොතිබුණු බැවින් දඩ මුදල්ද ගෙවීමට සිදුවී තිබුණි.	ඉදිරියේදී මෙවැනි දේ සිදු නොවීමට වගබලා ගන්නා බව.	නියමිත දිනට බලපත්‍ර ලබාගැනීම සිදු කළ යුතුය.
(ඊ)	2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු. 273,303,702 ක ශේෂය තුළ වර්ෂ 02 ත් 03 ත් අතර රු. 81,380,179 ක්ද ඇතුළත්ව තිබුණි.	පරීක්ෂා කර එම මුදල් නොලැබෙන්නනේ නම් කපා හැරීමට නිර්දේශ කිරීමට මහ සභාව වෙත යොමු කිරීමට කටයුතු කරන බව.	ලැබිය යුතු ශේෂ අයකර ගත යුතුය.
(උ)	2024 දෙසැම්බර් 31 දිනට රු. 219,979,131 ක් වූ විවිධ ණය හිමියෝ ශේෂය තුළ වර්ෂ 03 ත් 04 ත් අතර රු. 52,119,724 ක් විය.	ඉදිරියේදී ගෙවීමට සිදුවිය හැකි බැවින් ණයහිමි වෙන් කිරීම කපා හැරීමද සිදු කළ නොහැකි බව.	ණයහිමි ශේෂ හඳුනාගෙන නිරවුල් කළ යුතුය.

3.3 වත්කම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
සභාව සතු JCB යන්ත්‍රයක් 2021 වර්ෂයේ සිට ද ට්‍රැක්ටර් රථයක් 2022 වර්ෂයේ සිට ද අක්‍රීයව පැවතුණි.	JCB යන්ත්‍රය අලුත්වැඩියා කටයුතු සිදු කරන බව හා ට්‍රැක්ටර් රථයේ අමතර කොටස් සොයා ගැනීමට නොහැකි බව.	අලුත්වැඩියා හා නඩත්තු කටයුතු අප්‍රමාදව සිදුකළ යුතුය. නැතහොත් අපහරණ කටයුතු කිරීම සිදුකළ යුතුය.

3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1(අ) ප්‍රකාරව අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් කර ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු වුවද සභාව විසින් එවැනි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් ඉදිරියේදි සකස් කරන බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළ යුතුය.

3.5 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
තනතුරු වර්ග තුනක පුරප්පාඩු සේවක සංඛ්‍යාව 92 ක් විය. අංක 25/2014 සහ අංක 29/2019 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවලින් සහ 2024 ජුලි 01 දින බඳවා ගැනීම් මත ඇති වූ අතිරික්ත සේවක සංඛ්‍යාව 46 ක් වූ අතර එම පත්වීම් අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	අනුමත කාර්ය මණ්ඩලයේ කිසිදු වෙනසක් ප්‍රධාන ලේකම්ගේ අවසරයක් නොමැතිව සිදු කළ නොහැකිය බව.	අනුමත කාර්ය මණ්ඩලය සමාලෝචනය කර සංශෝධන අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුය.

4. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාව විසින් පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම 2014 පෙබරවාරි 17 දිනැති PEP/RED/01/04/2014/01 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි.	චක්‍රලේඛය ප්‍රකාරව පනවා තිබුණු අතුරු ව්‍යවස්ථාව අනුව අයවැය ඇස්තමේන්තු හා ඉදිරි ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කරන බව.	චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතුය.

4.2 අයවැය පාලනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
අපේක්ෂිත කාර්යයන් සිදු නොකිරීම නිසා රු. 66,071,996 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.	සංකේත ප්‍රතිපාදන මුදලක් ලෙස රු. 100 ක මුදලක් වෙන් කරනු ලබන්නේ එම වියදම අදාළ වර්ෂය තුළ සිදුවේද නොවේද යන්න නිශ්චිතව ප්‍රකාශ කළ නොහැකි නිසාය. නමුත් බලාපොරොත්තු විය හැකි වියදමක් ලෙස පවත්වාගෙන යනු ලබන වියදම් බව.	අයවැය ලේඛනය පාලන කාරකයක් ලෙස යොදාගත යුතුය.